# කන්ද උඩරට ගමක කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය පිළිබඳ අධ්‍යයනයක්
# (වලපනේ "තෙරිපැහැ" ග්‍රාමය ආශ්‍රයෙන්)

## හැඳින්වීම

සාම්ප්‍රදායික සිංහල ගැමි සමාජය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී දෙස් විදෙස් සමාජ හා මානව විද්‍යාඥයෝ බොහෝ දෙනෙකු (Ryan: 1953, Peris: 1956, Thambiah: 1958, Leach: 1961, Yalman: 1967, Obeysekara: 1967, Spencer: 1990) ලාංකීය සමාජයේ සමාජ ව්‍යුහය සහ සංවිධානය (Social Structure and Organization) පිළිබඳ විවිධ මාතෘකා ඔස්සේ අධ්‍යයනය කිරීමට යොමු වී තිබේ. මෙම බොහෝ අධ්‍යයන සාම්ප්‍රදායික සිංහල ගැමි සමාජය කේන්ද්‍ර කොට ගෙන කරනු ලැබූ ඒවා වේ. මේවා ක්ෂුද්‍ර අධ්‍යයන (Micro Studies) වශයෙන් සිංහල ගැමි සමාජය තුල සංවිධානය වී තිබූ පවුල (Family) විවාහය (Marriage) ඥාතීත්වය (Kinship) කුලය (Caste) ඉඩම් භුක්තිය (Land Tenure) සහ ආගම (Religion) වැනි විචල්‍යයන් පදනම් කරගෙන කරනු ලැබූ අධ්‍යයන වේ. මෙම විචල්‍යයන් අතරින් සාම්ප්‍රදායික සමාජ ව්‍යුහය තුළ කුලය, ඉඩම් භුක්තිය, යන විචල්‍යයන් බොහෝ සමාජ හා මානව විද්‍යාඥයින්ගේ (Ryan: 1953, Kodrington: 1980, Peris: 1956, Yalman: 1967, Obeysekara: 1967, Leach: 1961) අධ්‍යයනයන්ට භාජනය වුවත් නූතන සංකීර්ණ සමාජ පරිසරය තුළ මෙම විචල්‍යයන් පිළිබඳ අධ්‍යයනය කිරීමට වැඩි අවධානයක් යොමු නොකරන බව පැහැදිලි වේ. මේ

නිසා වර්තමාන සමාජ ව්‍යුහය තුළ මෙම විචල්‍යයන්ගේ ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීම කාලෝචිත වේ.

මීට අමතරව මේ රටේ සාම්ප්‍රදායික සමාජ ව්‍යුහය පිළිබඳ අධ්‍යයනය කර ඇති බොහෝ දෙනා කුලය සහ ඉඩම් භුක්තිය පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඇති බව එම අධ්‍යයනයන් පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වේ. නමුත් ඔවුන් මෙම කුලය සහ ඉඩම් භුක්තිය පිළිබඳ කරන ලද අධ්‍යයනයන් මගින් මෙම විචල්‍යයන් වෙන් වෙන් වශයෙන් සමාජය තුළ සංවිධානය වී තිබූ ආකාරය හඳුනා ගැනීමට උත්සහා ගෙන තිබේ. විශේෂයෙන් බ්‍රයිස් රයන් සිංහල කුල ක්‍රමය විස්තරාත්මකව පැහැදිලි කිරීමට උනන්දු වී තිබේ(1963). රැල්ප් පීරිස් සාම්ප්‍රදායික උඩරට සමාජයේ ක්‍රියාත්කම වූ කුලය සහ ඉඩම් භුක්තියේ පදනම විග්‍රහ කරනු ලබයි (1956). මේ රටේ ඉඩම් භුක්තිය පිළිබඳ වඩාත් පුළුල් විග්‍රහයක් කරනු ලබන්නේ ගනනාත් ඔබේසේකර විසිනි. රෝම ලන්දේසි නීතිය හඳුන්වා දීමත් සමග ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්ති ක්‍රමය කෙරෙහි එය බලපාන ආකාරය සම්බන්ධයෙන් ඔහු විසින් මහඟු අධ්‍යයනයක් කර තිබේ(1967). මීට අමතරව ඊ. ආර්. ලීච් සම්ප්‍රදායික වියළි කලාපීය ගැමි සමාජයේ ස්වභාවය හඳුනා ගැනීමට උත්සාහ කරන ලදී. ඉඩම් භුක්තිය සහ ජල පාලනය වැනි මිනිසුන්ගේ ජීවන පැවැත්ම හා සම්බන්ධ සාධක ඥාති ක්‍රමයේ ස්වභාවය තීරණය කළ අයුරු ඔහු මෙම අධ්‍යයනයෙන් විග්‍රහ කර ඇත. (1961) නූර් යාල්මන් කන්ද උඩරට සමාජයේ ඥාති මූලධර්ම වලට අමතරව කුල ක්‍රමය පිළිබඳව ද සොයා බැලීමට උත්සාහ ගෙන තිබේ(1967). මීට අමතරව මේ රටේ සාම්ප්‍රදායික කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය පිළිබඳ මානව විද්‍යාත්මක වටිනාකමකින් යුත් කරුණු රාශියක් අධිරාජ්‍යවාදී පාලන සමයේ මේ රටේ ජීවත් වූ විදේශීය පරිපාලන නිලධාරීන්ගේ වාර්තා සහ ඔවුන් විසින් රචිත කෘතීන් (Davy: 1821, D'oyly: 1917, Tennent: 1950) මගින් අනාවරණය කරනු ලබයි. නමුත් මෙම සියල්ල පරීක්ෂා කර බැලීමේ දී පෙනී යන්නේ මෙම සියලු දෙනා කුලය හා ඉඩම් භුක්තිය සාම්ප්‍රදායික සමාජය තුල ක්‍රියාත්මක වූ ආකාරය වෙන් වෙන් වශයෙන් අධ්‍යයනය කර ඇති නමුත් මේවා අතර ඇති සබඳතාව හඳුනාගැනීමට වැඩි අවධානයක් යොමු කර නොමැති බවයි. නමුත් ක්‍රියාත්මක වීමේ දී මෙම විචල්‍යයන් අතර පැහැදිලි සබඳතාවක් හඳුනාගත හැකි වේ. මේ නිසා කුලය සහ ඉඩම් භුක්තිය ලාංකීය සමාජය තුල එකිනෙකට බද්ධ වී ඇති විචල්‍යයන් දෙකක් ලෙස හඳුනාගෙන මේවා අතර ඇති සබඳතාවය සොයා බැලීම මෙම අධ්‍යයනයේ දී සිදුවිය.

## අධ්‍යයන ගැටළුව

සාම්ප්‍රදායික සිංහල සමාජය පිළිබඳ වඩාත් ගැඹුරින් අධ්‍යයනය කිරීමේ දී මේ රටේ සමාජ, ආර්ථික, සහ සංස්කෘතික පරිසරය නිර්මාණය වීමේ දී ඉතා දැඩි බලපෑමක් කරනු ලැබූ විචල්‍යයන් දෙකක් ලෙස කුලය සහ ඉඩම් භුක්තිය හඳුනාගත හැකි වේ. මේ හේතුව නිසාම මීට ඉහත දී විග්‍රහ කල පරිදි සාම්ප්‍රදායික සිංහල ගැමි සමාජය අධ්‍යයනය කල බොහෝ දෙනා (Ryan 1953, Leach: 1961, Yalman: 1967, Obeysekara: 1967) මේ පිළිබඳ වඩාත් පුළුල්ව අධ්‍යයනය කර තිබේ. ඔවුන්ගේ එම අධ්‍යයනය දෙස විමර්ශනාත්මකව බැලීමේ දී පෙනී යන්නේ ඔවුන් කුලය සහ ඉඩම් භුක්තිය වෙන් වෙන් වශයෙන් ගෙන අධ්‍යයනය කරනු ලැබුව ද ඒවා අතර ඇති සම්බන්ධතාවය පිළිබඳ අධ්‍යයනය කිරීමට උත්සාහ ගෙන නොමැති බවයි. යාල්මාන්ගේ අධ්‍යයනය (1967) තුල වුව ද ඉඩම් භුක්තිය සහ කුලය පිළිබඳ විග්‍රහයන් දක්නට ලැබුන ද මේවා අතර ඇති සම්බන්ධතාවය පිළිබඳ අධ්‍යයනය කිරීමට උත්සාහ ගෙන නොමැති බව පැහැදිලි වේ. නමුත් කුලය සහ ඉඩම් භුක්තිය අතර කිසියම් සබඳතාවක් සාම්ප්‍රදායික මෙන්ම නූතන සමාජයේ ද දක්නට ලැබේ. විශේෂයෙන් කන්ද උඩරට සාම්ප්‍රදායික සමාජයේ කුලය, ඥාතිත්වය සහ විවාහය පිළිබඳ විග්‍රහ කරන යාල්මාන් (1967) සඳහන් කරන්නේ ඉහත විචල්‍යයන් තීරණය කිරීමේ දී ඉඩම් භුක්තිය වැදගත් වී ඇති බවයි. මේ නිසා කුලය සහ ඉඩම් භුක්තිය අතර ඇති සම්බන්ධය සොයා බැලීම සඳහා කරනු ලබන මෙම අධ්‍යයනයේදී,

**ශ්‍රී ලංකාවේ කුලය සහ ඉඩම් භුක්තිය අතර සම්බන්ධයක් පවතීද?**

යන අධ්‍යයන ගැටලුව ගොඩ නගා ගෙන ඒ ඔස්සේ අධ්‍යයනය ඉදිරියට මෙහෙයවීමට බලාපොරොත්තු වේ. මෙහි දී ශ්‍රී ලාංකීය සමාජයේ මෙම විචල්‍යයන් මූලික වශයෙන් ක්‍රියාත්මක වන ආකාරය හඳුනාගෙන ඒවා අතර සම්බන්ධයක් පවතිනවා ද යන්න සොයා බැලීමට අදහස් කෙරේ.

## අධ්‍යයන ක්ෂේත්‍රය

මෙම ගැටළුව අධ්‍යයනය කිරීම සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් තෙරිපැහැ ග්‍රාමය තෝරා ගනු ලැබිය. තෙරිපැහැ මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වේ. තෙරිපැහැ පරිපාලනමය වශයෙන් ග්‍රාම නිළධාරී කොට්ඨාශ 07 ට බෙදා තිබේ. එනම් මල්ලාගම, දුල්න, හෙලගම, හැගස්උ ල්ල, අඹගහතැන්න, තෙරිපැහැ සහ බොලගන්දාවෙල යනුවෙන් හඳුනාගත හැකි වේ. මෙම ගමට පිවිසිය හැකි මාර්ග දෙකකි.

පළමුව වැදගත් වන්නේ මහනුවර හඟුරන්කෙත මාර්ගයයි. දෙවනුව නුවරඑළිය රාගල මාර්ගයයි. මෙම මාර්ග දෙකම වතුමුල්ල (වලපනේ) නගරයේ දී හමුවන අතර එතැන් සිට වතුමුල්ල නිල්දණ්ඩාහින්න මාර්ගයේ කි. මී. 08 ක් පමණ යා යුතුය. නිල්දන්ඩාහින්න ගමට ආසන්නයේ ඇති කුඩාම නගරයයි. එතැන් සිට කි. මී. 12 ක් පමණ දුරින් ගම පිහිටා ඇති අතර රජයේ හෝ පෞද්ගලික බස් සේවාවකින් පැය 1 1 1/2 ත් අතර කාලයකදී ගමට ළඟා විය හැකිය. භූගෝලීය පිහිටීම අනුව රන්දෙනිගල ජලාශයට දකුණු පසින් පිහිටි විශාල කඳු වැටියකින් ආවරණය වූ තැනිතලාවක ගම පිහිටා තිබේ.

## අධ්‍යයන පරමාර්ථ

මෙම අධ්‍යයනයේ දී කුලය සහ ඉඩම් භුක්තිය ලාංකීය සමාජය තුළ එකිනෙකට බද්ධ වී ඇති විචල්‍යයන් දෙකක් ලෙස හඳුනාගෙන මේවා අතර ඇති සබඳතාවය සොයා බැලීම ප්‍රධාන පරමාර්ථය වූ අතර ඊට අමරතව ඉටු කර ගැනීමට අපේක්ෂිත අවශේෂ පරමාර්ථ කිහිපයක්ද විය. එනම්,

- සාම්ප්‍රදායික සිංහල ගැමි සමාජයේ කුලය සහ ඉඩම් භුක්තිය අතර තිබූ සබඳතාවය හඳුනා ගැනීම
- සාම්ප්‍රදායික සමාජයේ කුලය සහ ඉඩම් භුක්තිය අතර තිබූ සබඳතාවය නූතනයේ වෙනස් වී ඇති ආකාරය හඳුනා ගැනීම
- කුලය සහ ඉඩම් භුක්තිය අතර සබඳතාවය වෙනස්වීමට බලපා ඇත්තේ කවර අන්දමේ හේතු සාදක දැයි සොයා බැලීම

## අධ්‍යයන ක්‍රමවේදය

ක්ෂේත්‍ර අධ්‍යයන සැලැස්මක් ආශ්‍රයෙන් සිදු කළ මෙම අධ්‍යයනයේ දී තුලනාත්මක ක්‍රමය සහ සංඛ්‍යාත්මක ක්‍රමය (Comparative Method and Statistical Method) මූලික වශයෙන් යොදා ගනු ලැබීය. මෙම අධ්‍යයනයේ දී යාල්මාන් ගේ අධ්‍යයනය (1967) ප්‍රධාන මූලාශ්‍රයක් වශයෙන් යොදා ගනිමින් සාම්ප්‍රදායික සමාජ අවධියේ කුලය සහ ඉඩම් භුක්තිය අතර තිබූ සබඳතාවය හඳුනාගෙන එම තත්වය වර්තමාන ස්වරූපයේ කෙබඳු ස්වරූපයක් ගෙන තිබේ ද යන්න සොයා බැලීමේ දී ඒ සඳහා වඩාත් උචිතම ක්‍රමය ලෙස තුලනාත්මක ක්‍රමය යොදා ගනු ලැබීය.

මීට අමතරව මෙම අධ්‍යයනයේ දී ඉඩම් භුක්තිය ප්‍රධාන විචල්‍යයක් වශයෙන් යොදාගෙන ඇති බැවින් ඒ මගින් හෙළි කර ගන්නා ප්‍රමාණාත්මක දත්ත වඩාත් හොඳින් විශ්ලේෂණය කිරීම සඳහා සංඛ්‍යාණාත්මක ක්‍රමය භාවිතා කරන ලදි.

## දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම

මෙම අධ්‍යයනය ක්ෂේත්‍ර අධ්‍යයන සැලැස්මක් (Field Study) ආශ්‍රයෙන් සිදු කළ බැවින් ගුණාත්මක දත්ත (Qualitative Data) රැස් කිරීමේ ශිල්ප ක්‍රම වෙත මූලික අවධානය යොමු කරනු ලැබීය. ඒ අනුව ගුණාත්මක දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම අතරින් සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය (Participant Observation Method and Interview Method) ප්‍රධාන වශයෙන් මෙහි දී භාවිතා කරන ලදි. සහභාගීත්ව නිරීක්ෂණය අනුව දත්ත රැස් කිරීමේ දී අධ්‍යයන ක්ෂේත්‍රය තුල ජීවත් වෙමින් ගැමියන්ගේ ගැමි ජීවිතය හොඳින් හඳුනා ගැනීමට අවස්ථාව උදා විය. ගැමියන් සමඟ කටයුතු කිරීමේ දී ඔවුන් සමඟ ගොඩ නගා ගනු ලබන ලෙන්ගතුකම (Rapport) අවශ්‍ය දත්ත ලබාගැනීමට ඉතා වැදගත් වේ. ක්ෂේත්‍ර අධ්‍යයනයකදී මෙම ලෙන්ගතුකම අත්‍යවශ්‍ය දෙයක් බව (රත්නපාල: 2000;71) අවධාරණය කරයි. මෙවැනි අධ්‍යයනයක දී ගැමියන් සමඟ වෙසෙමින් ඔවුන්ගේ චර්යාවන් අදහස්, ආකල්ප හඳුනා ගැනීම නිවැරදි නිගමනයනට ඒමට හේතු වේ. මේ නිසා ඒ සඳහා වඩාත් උචිතම ශිල්ප ක්‍රමය වශයෙන් සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමය යොදා ගනු ලැබීය. මීට අමතරව දත්ත රැස් කිරීමේ දී සම්මුඛ සාකච්ඡා ක්‍රමය ද යොදා ගත් අතර විශේෂයෙන් ගමේ වැඩිහිටියන් මගින්, විදුහල්පති ග්‍රාම නිලධාරී, ආගමික නායකයින් වැනි පිරිසගෙන් අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා මෙම ක්‍රමය වැදගත් විය. තවද ඉඩම් භුක්තිය පිළිබඳ තොරතුරු ලබා ගැනීමේදී ජන සංගනන වාර්තා, ග්‍රාම නිලධාරී වාර්තා, ගොවිජන සේවා මධ්‍යස්ථානය සතු වාර්තා ද ඉතා වැදගත් විය. මෙම ලේඛන මගින් ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීමේදී ගමෙහි සංයුතිය, ඉඩම් හිමිකාරිත්වය, ඉඩම් කොටස් වල ප්‍රමාණය සහ ඊට අමතරව අධ්‍යාපනය, සෞඛ්‍යය, නිවාස වැනි පොදු පහසුකම් වල පසුබිමද හඳුනා ගැනිමට හැකියාව ලැබුණි

## දත්ත විශ්ලේෂණය

### සාම්ප්‍රදායික තෙරුතැන්න

මෙහි දී මූලික වශයෙන් මීට දශක පහකට පමණ පෙර තෙරිපැහැ ග්‍රාමයේ සමාජ පසුබිම කෙසේ නිර්මාණය වී තිබුණේ ද යන්නත් ඊට අමතරව ඉඩම් භුක්තිය සහ කුලය යන විචල්‍යයන් ගම තුළ සංවිධානය වී තිබූ ආකාරය පිළිබඳවත් හඳුනා ගැනීම වැදගත් වේ. මේ අනුව සාම්ප්‍රදායික තෙරුතැන්නේ ජනගහනය පහත සඳහන් පරිදි වේ.

**වගු අංක 01**

**සාම්ප්‍රදායික තෙරුතැන්නේ ජනගහනය**

| ගම | පුරුෂ | ස්ත්‍රී | එකතුව | නිවාස |
|---|---|---|---|---|
| වැකුඹුර (පහත් කුල ඇතුළුව) | 165 | 174 | 339 | 61 |
| හෙලගම | 109 | 114 | 223 | 38 |
| ගාල්පිටිය | 74 | 67 | 141 | 21 |
| හැගස්උල්ල | 27 | 22 | 49 | 07 |
| එඩුරුවත්ත | 26 | 16 | 42 | 12 |
| හිඟුරේවෙල | 26 | 27 | 53 | 10 |
| ලියන්ගහපිටිය | 24 | 16 | 40 | 08 |
| දුන්කළවත්ත | 26 | 24 | 50 | 13 |
| කීනගොල්ල | 14 | 18 | 32 | 04 |
| හේනේගම (හේන කුලය) | 15 | 15 | 30 | 07 |
| වළංකාරයෝ | 22 | 17 | 39 | 03 |
| කම්මල්කාරයෝ | 12 | 07 | 19 | 03 |
| බද්දේගම (බෙරව කුලයට අයත් ගාල්පිටිය හා හෙලගම ගෙවල් 03 ක් ඇතුළුව) | 78 | 68 | 146 | 27 |
| එකතුව | 618 | 585 | 1203 | 214 |

**(Yalman, 1967:27)**

ඉහත වගු අංක 01 අනුව තෙරිපැහැ ග්‍රාමයේ සමස්ථ ජනගහනයෙන් 234 ක් පහත් කුලවලට අයත් වේ. ගොවිගම කුලයට අයත් මුලු ජනගහනය 969 කි.තෙරිපැහැ ගමෙහි ඉඩම් භුක්තිය

පිළිබඳ විග්‍රහ කිරීමේ දී ගැමියන්ගේ ප්‍රධාන ආදායම කෘෂිකර්මාන්තය මත රඳා පවතින හෙයින් ඉඩම් සඳහා වැඩි වටිනාකමක් හිමි විය. මෙහි දී ගැමියන් කුඹුරු ගොවිතැනෙහි බහුලව යෙදුන අතර ඊට අමතරව හේන් ගොවිතැනෙහි ද නිරත වු බව දක්නට ලැබේ. මේ අනුව 1955 වන විට තෙරිපැහැ ගමෙහි හඳුනාගත හැකි වු කුඹුරු ඉඩම් ප්‍රමාණය පහත පරිදි වේ.

වගු අංක 02

**සාම්ප්‍රදායික තෙරුතැන්නේ කුඹුරු ඉඩම් හිමිකාරීත්වය**

| ඉඩම් කොටසේ ප්‍රමාණය (පැල්) | ඉඩම් හිමියන් සංඛ්‍යාව | වැඩිහිටි ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස | මුළු ඉඩම් කොටස්වල එකතුව (පැල්) | මුළු ඉඩම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 1 හෝ 1 ට අඩු | 64 | 22.4 | 51.5 | 24.0 |
| 1 2 | 48 | | 90 | |
| 2 3 | 20 | | 55 | |
| 3 4 | 17 | | 63.5 | |
| 4 5 | 09 | 10.8 | 41 | 35.2% |
| 5 6 | 05 | | 29 | |
| 6 7 | 03 | | 20 | |
| 7 10 | 05 | | 40.5 | |
| 10 27.5 | 11 | 3.2 | 201.5 | 40.8% |
| එකතුව | 182 | 36.4% | 592 | 100% |

**(Yalman, 1967:39)**

සාම්ප්‍රදායික තෙරිපැහැ ග්‍රාමයේ කුල සංයුතිය පිළිබඳ විග්‍රහ කිරීමේ දී සමස්ථ ජනගහනය කුල 5 ට අනුව බෙදී ගොස් ඇති අයුරු දක්නට ලැබේ. මෙහි දී ඉහළම කුලය ගොවි කුලය වු අතර පහත් යැයි සම්මත කුල අතර බෙරව, හේන, ආචාරී හා කුඹල් කුල හඳුනාගත හැකි වේ.

වගු අංක 03

**සාම්ප්‍රදායික තෙරුතැන්නේ කුල සංයුතිය**

| කුලය | පුරුෂ | ස්ත්‍රී | එකතුව | නිවාස සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ගොවිගම | 491 | 478 | 969 | 174 |
| හේන | 15 | 15 | 30 | 07 |
| වළංකාරයෝ | 22 | 17 | 39 | 03 |
| ආචාරී | 12 | 07 | 19 | 03 |
| බෙරව | 78 | 68 | 146 | 27 |
| එකතුව | 618 | 585 | 1203 | 214 |

**(Yalman, 1967:26)**

මෙම කුලය සංවිධානය වී තිබු ආකාරය විග්‍රහ කිරීමේ දී ආර්ථික හා සමාජීය වශයෙන් කුල අතර ක්‍රියාත්මක වු උස් පහත් බෙදීමක් හඳුනාගත හැකි වේ. කුල අතර ක්‍රියාත්මක වු මෙම උස් පහත් බෙදීම කරුණු කිහිපයක් ඔස්සේ වැදගත් වේ. ආමන්ත්‍රණයේ දී කුල අතර ඇති උස් පහත් බෙදීම පහත සඳහන් පරිදි දැකිය හැකිය.

වගු අංක 04

**විවිධ කුල වලට අයත් පුද්ගලයන් ආමන්ත්‍රණයේ දී යොදාගත් ඇමතුම් පද**

| **ආමන්ත්‍රණය කරන්නා** | **ඇමතුම ලබන්නා හඳුන්වන නම** | | | | |
|---|---|---|---|---|---|
| | **ගොවිගම** | **හේන** | **බද්දේ** | **වළංකාරයෝ** | **ආචාරී** |
| ගොවිගම | | හේනේ<br>මාමා<br>හේනේ<br>නැන්දා | පුද්ගල නාමයෙන් ආමන්ත්‍රණය කරයි | | |
| හේන | හාමුදුරුවෝ | | මල්ලි,<br>අයියා | විදානි,<br>ඩිංගිරි,<br>අම්මා | ගුරුන්නාන්සේ |
| බද්දේ | හාමුදුරුවෝ | මල්ලි,<br>අයියා | | මලලි,<br>අයියා | විදානේ<br>මහත්තයා,<br>හක්ගෙඩි අම්මා |

| | | | | | |
|---|---|---|---|---|---|
| වළංකාරයෝ | හාමුදුරුවෝ | මාමා, නැන්දා | මල්ලි, අයියා | | විදානී |
| ආචාරි | හාමුදුරුවෝ | පුද්ගල නාම | පනික්කියා, නැන්දියෝ | පුද්ගල නාම | ගුරුන්නාන්සේ |

**(Yalman, 1967;)**

මීට අමතරව අසුන් ගැනීමේ දී, ආහාර ගැනිමේ දී සහ ලිංගික කටයුතුවල දී ද කුල බේදය හොදින් හඳුනාගත හැකි විය.

මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථයක් වශයෙන් සාම්ප්‍රදායික තෙරුතැන්න ග්‍රාමයේ කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය අතර පැවති සම්බන්ධය විමසා බැලීමේ දී මෙම ග්‍රාමයේ පහත් යැයි සම්මත කුල වලට සීමිත ඉඩම් ප්‍රමාණයක් හිමිව තිබූ බව පැහැදිලි වේ. විශේෂයෙන් සාම්ප්‍රදායික තෙරුතැන්න ග්‍රාමයේ කුඹුරු ඉඩම් හිමිකාරත්වය පිළිබඳ පමනක් තොරතුරු මෙහි දී ලබා ගත හැකි වූ අතර වගු අංක 05 අනුව එම තත්වය වඩාත් හොදින් තහවුරු වේ.

වගු අංක 05

සාම්ප්‍රදායික තෙරුතැන්නේ පහත් කුල වලට අයත්ව තිබූ කුඹුරු ප්‍රමාණය

| කුලය | වැඩිහිටි ජනගහනය (අවු. 20 ට වැඩි) | ඉඩම් හිමියන් ප්‍රමාණය | ඉඩම් ප්‍රමාණය (පැල්) |
|---|---|---|---|
| ගොවිගම | 696 | 162 | 521 |
| ආචාරි | 09 | 02 | 21 |
| වළංකාරයෝ | 14 | - | - |
| රදව් | 13 | 04 | 18.5 |
| බෙරව | 62 | 14 | 31.5 |
| එකතුව | 98 | 182 | 592 |

**(Yalman, 1967:64)**

ඉහත වගු අංක 05 අනුව සමස්ථ කුඹුරු ඉඩම් ප්‍රමාණය පැල් 592 ක් වන අතර එම සමස්ථ කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් පහත් යැයි සම්මත කුල වලට හිමිව ඇත්තේ කුඹුරු ඉඩම් පැල් 71 ක් පමන වේ. ප්‍රතිශතයක් වශයෙන් සමස්ථ කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් 88% ක් පමන ගොවි කුලයට හිමිව තිබේ. මේ අනුව සාම්ප්‍රදායික තෙරුතැන්න ගමෙහි කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය අතර

පැවති සම්බන්ධය විමසා බැලීමේ දී මෙම ග්‍රාමයේ පහත් යැයි සම්මත කුල වලට සීමිත ඉඩම් ප්‍රමාණයක් හිමිව තිබු බවත් ඔවුන්ට සාපේක්ෂව ගොවි කුලයට විශාල ඉඩම් ප්‍රමාණයක් හිමිව තිබූ බවත් පැහැදිලි වේ.

## නූතන තෙරුතැන්න

සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂව නූතනයේ තෙරුතැන්න ග්‍රාමයේ බොහෝ අංශයන්ගේ වෙනස්වීම් සිදු වී ඇති බව පැහැදිලි වේ. අධ්‍යාපනය, ප්‍රවාහනය, සෞඛ්‍යය, නිවාස, විදුලිබලය, සහ රැකියා වැනි අංශ මෙහි ද වැදගත් වේ.

වර්තමාන තෙරුතැන්නේ ජනගහනය සම්බන්ධව අවධානය යොමු කිරීමේ දී සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂව වර්ධනය වී ඇති අයුරු දක්නට ලැබේ.

වගු අංක 06

වර්තමාන තෙරුතැන්නේ ජනගහනය

| ප්‍රභේදය | පූලාන | මල්ලාගම | අඹගහතැන්න | හෙලගම | බොලගන්දාවෙල | හැගස්පැල්ල | කෙරිපැහැ | උප එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| පුරුෂ | 188 | 268 | 370 | 396 | 181 | 191 | 180 | 1774 | 49.35 |
| ස්ත්‍රී | 152 | 292 | 372 | 444 | 188 | 197 | 176 | 1821 | 50.65 |
| එකතුව | 340 | 560 | 742 | 840 | 369 | 388 | 356 | 3595 | 100.00 |
| **වයස් කාණ්ඩය අනුව** | | | | | | | | | |
| < 5 අවුරුදු | 31 | 44 | 111 | 65 | 58 | 42 | 39 | 390 | 10.85 |
| 5 9 | 36 | 120 | 100 | 41 | 56 | 58 | 42 | 453 | 12.60 |
| 10 14 | 53 | 101 | 125 | 83 | 49 | 49 | 41 | 501 | 13.94 |
| 15 29 | 78 | 108 | 112 | 192 | 103 | 63 | 72 | 728 | 20.25 |
| 30 59 | 115 | 139 | 160 | 160 | 57 | 126 | 113 | 1070 | 29.76 |
| 60 69 | 17 | 39 | 92 | 72 | 31 | 29 | 33 | 313 | 8.71 |
| > 70 | 10 | 09 | 42 | 27 | 15 | 21 | 16 | 140 | 3 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| එකතුව | 340 | 560 | 742 | 840 | 369 | 388 | 356 | 3595 | 100.00 |

**ක්ෂේත්‍ර දත්ත 2002**

ඉහත වගු අංක 07 අනුව නූතනයේ තෙරුතැන්නේ මුලු ජනගහනය 3595 ක් ලෙස දක්වේ. එය සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂව (වගු අංක 01) 198% ක වැඩි වීමකි.

නූතන තෙරුතැන්න ගමෙහි අර්ථ ක්‍රමය පිළිබඳ විග්‍රහ කිරීමේ දී සාම්ප්‍රදායික රැකියාව වූ ගොවිතැනෙන් යම් තරමකට ඉවත් වී වෙනත් රැකියාවන්හී යෙදීමේ ප්‍රමාණාත්මක වර්ධනයක් නූතනයේ දක්නට ලැබේ. මේ වන විට රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ රැකියාවන් සඳහා ගැමියන් යොමු වී ඇති බව පැහැදිලි වේ.

වගු අංක 07

**වර්තමාන තෙරුතැන්නේ රැකියා තත්වය**

| රජයේ | දූලාන | මල්ලාගම | අඹගහතැන්න | කෙලගම | මොලගොන්දාවෙල | හැගස්ටල්ල | කෙරිපැහැ | උප එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| හමුදා/පොලිසි | 1 | 9 | 17 | 20 | 5 | 10 | 7 | 73 | 18.71 |
| ගුරු | - | 2 | 4 | 8 | 1 | 1 | 5 | 21 | 5.40 |
| දෙපාර්තමේන්තු | 1 | 6 | 12 | 14 | 4 | 10 | 1 | 48 | 12.30 |
| බැංකු | - | - | - | 2 | - | 1 | 2 | 3 | 0.76 |
| වෙනත් | 1 | 2 | 2 | - | - | 6 | - | 13 | 3.33 |
| **පෞද්ගලික** | | | | | | | | | |
| ඇඟලුම් කම්හල් | 13 | 30 | 26 | 51 | 8 | 18 | 8 | 154 | 39.50 |
| කර්මාන්ත ශාලා | - | 20 | 17 | 10 | - | 7 | - | 54 | 13.85 |
| වෙනත් | 4 | 1 | 6 | 3 | 3 | 7 | - | 24 | 6.15 |
| එකතුව | 20 | 70 | 84 | 108 | 21 | 60 | 23 | 390 | 100 |

**ක්ෂේත්‍ර දත්ත 2002**

අධ්‍යාපනික පසුබිම සැලකීමේ දී 1940 කන්නන්ගර යෝජනා අනුව නිදහස් අධ්‍යාපනික අවස්ථාවන් ලබා දීමත් ඊට අමතරම ග්‍රාමීය අධ්‍යාපනය නගා සිටුවීමට විවිධ වැසටහන් රජය හඳුන්වා දීමත් සමග ග්‍රාමීය අධ්‍යාපනය පුළුල් වීමට හේතු වී තිබේ.

තෙරුතැන්න ගමෙහි ද මෙම තත්වයන් මත අධ්‍යාපන අවස්ථාවන් පුළුල් වීම හොඳින් දැකිය හැකිය.

වගු අංක 08

**වර්තමාන තෙරුතැන්නේ අධ්‍යාපන පසුබිම**

| **අධ්‍යාපන මට්ටම** | දූලාන | මල්ලාගම | අඹගහතැන්න | හෙලගම | බොලගන්දාවෙල | හැගස්උල්ල | තෙරිපැහැ | උප එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| වසර 15 | 199 | 321 | 160 | 412 | 78 | 43 | 114 | 1327 | 43.41 |
| 5 8 | 63 | 79 | 123 | 211 | 108 | 78 | 79 | 741 | 24.24 |
| 8 අ. පො. ස. සා.පෙළ | 15 | 43 | 170 | 92 | 81 | 69 | 57 | 527 | 17.24 |
| අ.පො.ස /උ/පෙළ | 1 | 9 | 74 | 22 | 13 | 23 | 24 | 166 | 5.43 |
| විශ්වවිද්‍යාල | - | - | 1 | 2 | - | 1 | - | 4 | 0.13 |
| පාසැල් නොගිය | 52 | 43 | 57 | 37 | 31 | 29 | 43 | 292 | 9.55 |
| එකතුව | 330 | 495 | 776 | 776 | 311 | 243 | 317 | 3057 | 100.00 |

**ක්ෂේත්‍ර දත්ත** 2002

නූතන තෙරුතැන්නේ ඉඩම් භුක්තිය පිළිබඳ විමසීමේ දී කුඹුරු ගොවිතැනෙහි අදටත් නියැලෙන බව පැහැදිලි වේ. නමුත් ඊට අමතරව දුම්කොළ වගාව සඳහා ගැමියන් වැඩි නැඹුරුවක් නූතනයේ දක්නට ලැබේ. හේන් ගොවිතැන වර්තමානයේ බහුලව දක්නට නොමැත. රජය විසින් ගම වටා ඇති වනාන්තරය රක්ෂිත වනාන්තර ලෙස නම් කිරීම නිසා ගැමියන්ට හේන් ගොවිතැන සඳහා තිබූ ඉඩ කඩ ඇහිරී ගොස් තිබේ. මේ වන විට තෙරුතැන්න ගමෙහි ඉඩම් ප්‍රමාණාත්මක වශයෙන් සහ ඒවා බෙදී ගොස් ඇති ආකාරය පහත සඳහන් පරිදි වේ.

වගු අංක 09

වර්තමාන තෙරුතැන්නේ ග්‍රාම නිලධාරි වසම් අනුව ඉඩම් බෙදී ඇති ආකාරය

(ප්‍රමාණය අක්කර)

| අධ්‍යාපන මට්ටම | ධූලන | මල්ලාගම | අඹගහකැත්ත | සෙලගම | බොලගස්දාමෙල | හැගස්ඩල්ල | කෙරිපැහැ | උප එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| ගොඩ ඉඩම් | 192 | 171 | 126 | 175 | 262 | 144 | 199 | 1269 | 72.0 |
| කුඹුරු ඉඩම් | 46 | 40 | 4 | 79 | 234 | 30 | 62 | 495 | 28.0 |
| උප එකතුව | 238 | 211 | 130 | 254 | 496 | 174 | 261 | 1764 | 17.5 |
| වනාන්තර | 232 | - | 78 | 12 | 500 | 7500 | 20 | 8342 | 82.5 |
| එකතුව | 470 | 211 | 208 | 266 | 996 | 7574 | 281 | 10106 | 100.00 |

**ක්ෂේත්‍ර දත්ත 2002**

වගු අංක 10

වර්තමාන තෙරුතැන්නේ ඉඩම් හිමිකාරීත්වය

| අයිති වූ ඉඩම් කොටසේ ප්‍රමාණය | ඉඩම් හිමියන් සංඛ්‍යාව සහ එහි ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|
| | ගොඩ ඉඩම් | % | කුඹුරු ඉඩම් | % |
| < ¼ | 5 | 0.9 | 7 | 1.5 |
| ¼ - ½ | 43 | 7.6 | 74 | 16.2 |
| ½ - 1 | 89 | 15.8 | 175 | 38.5 |
| 1 – 2 | 185 | 32.7 | 156 | 34.3 |
| 2 – 5 | 182 | 32.2 | 39 | 8.6 |
| > 5 | 61 | 10.8 | 4 | 0.9 |
| එකතුව | 569 | 100.00 | 455 | 100.0 |

ක්ෂේත්‍ර දත්ත 2002

වගු අංක 11

**වර්තමාන තෙරුතැන්නේ ඉඩම් හිමිකාරත්වය වගා කරන ස්වභාවය අනුව**

| වගා කරන ස්වභාවය | පුද්ගල සංඛ්‍යාව |
|---|---|
| ඉඩම් හිමි වගා කරන | 211 |
| ඉඩම් හිමි වගා නොකරන | 244 |
| ඉඩම් අහිමි අඳ ගොවියන් | 324 |
| ඉඩම් අහිමි කුලී ශ්‍රමිකයන් | 131 |

**ක්ෂේත්‍ර දත්ත** 2002

වර්තමාන තෙරුතැන්න ග්‍රාමයෙ හි කුලය සංවිධානය වි ඇති ආකාරය හඳුනාගැනීම මී ළගට වැදගත්ට වි. මෙහි දී සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂව කුල ක්‍රමය කිසියම් දුරකට වෙනස් වී බව පැහැදිලි වේ. මේ තත්වය තව දුරටත් තෙරුතැන්නේ කුල සංයුතිය පිළිබඳ අවධානය යොමුකිරීමෙන් පැහැදිලි වේ.

වගු අංක 12

**වර්තමාන තෙරුතැන්නේ ග්‍රාම නිලධාරි වසම් අනුව කුල සංයුතිය**

| කුලය | දූලාන | මල්ලාගම | අඹගහතැන්න | හෙලගම | බොලගෙන්දාවෙල | හැගස්ටල්ල | කෙරිපොත | මුළු එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| ගොවිගම | 204 | 284 | 217 | 400 | 75 | 239 | 243 | 1662 | 75.3 |
| ආචාරි | - | - | 11 | - | 02 | - | - | 13 | 0.6 |
| බෙරව | 03 | 4 | 220 | 20 | 116 | 05 | 46 | 414 | 18.8 |
| කුඹල් | - | - | 03 | - | - | - | - | 03 | 0.1 |
| හේන (රජක) | - | 56 | 02 | 04 | - | 03 | 10 | 75 | 3.4 |
| කරාව | - | - | 11 | 06 | 05 | 05 | 01 | 28 | 1.3 |
| සලාගම | - | - | - | - | - | 05 | - | 05 | 0.2 |
| දූරාව | 02 | 05 | - | - | - | - | - | 07 | 0.3 |
| එකතුව | 209 | 349 | 464 | 430 | 198 | 257 | 300 | 2207 | 100.00 |

**ක්ෂේත්‍ර දත්ත** 2002

නූතන තෙරුතැන්නේ කුලය සහ ඉඩම් භුක්තිය අතර සම්බන්ධතාවය විමසීමේ දී සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂව මෙම විචල්‍යයන් අතර සම්බන්ධතාවයේ වෙනස්වීම් සිදු වී ඇති බව පැහැදිලි වේ. මෙම තත්වය වඩාත් හොඳින් වගු අංක 12 කෙරෙහි අවධානය යොමු කිරීමෙන් පැහැදිලි වේ.

**වගු අංක 13**

**වර්තමාන තෙරුතැන්නේ කුලය සහ ඉඩම් හිමිකාරිත්වය**

| කුලය | කුඹුරු ඉඩම් (අක්කර) | ඉඩම් හිමියන් සංඛ්‍යාව | ගොඩ ඉඩම් (අක්කර) | ඉඩම් හිමියන් සංඛ්‍යාව | ජනගහනය |
|---|---|---|---|---|---|
| බෙරව | 52 | 51 | 90 | 56 | 414 |
| කරාව | 6.5 | 3 | 17.5 | 5 | 28 |
| ආචාරි | 1 | 1 | 1.5 | 3 | 13 |
| හේන (රජක) | 12.5 | 10 | 47 | 25 | 75 |
| කුඹල් | - | - | 1 | 1 | 3 |
| දූරාව | 2 | 3 | 4 | 4 | 7 |
| ගොවිගම | 359 | 361 | 1069 | 459 | 1664 |
| ගමට පිටස්තර අය සතු ඉඩම් | 62 | 36 | 39 | 12 | - |
| එකතුව | 492 | 455 | 1269 | 565 | 2204 |

**ක්ෂේත්‍ර දත්ත** 2002

## සමාලෝචනය සහ නිගමනය

මේ අනුව මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වන්නේ කුලය සහ ඉඩම් භුක්තිය අතර ඇති සබඳතාවය හඳුනාගැනීමයි. මෙම මූලික පරමාර්ථය තවදුරටත් විග්‍රහ කරගැනීමේ දී පහත සඳහන් කරුණු අනාවරණය කර ගත හැකි විය.

පළමුව සාම්ප්‍රදායික සමාජ අවධියේ කුලය හා ඉඩම් භුක්තිය අතර පැවති සම්බන්ධතාවය හඳුනාගනු ලැබීය. සාම්ප්‍රදායික අවධියේ දී කුල භේදය ඉතා හොඳින් ක්‍රියාත්මක වූ අතර ඉඩම් බෙදී යෑමේ දී මෙම තත්වය ප්‍රබල සාධකයක් ව පැවතුණි. ගොවිකුලය උසස්ම කුලය වශයෙන්

සැලකූ අතර වැඩි ඉඩම් ප්‍රමාණයක් ගොවිකුලය සහ එහි උප කොටස් සතු විය. පහත් යයි සම්මත කුලවලට හිමිව තිබුණේ සුළු ඉඩම් ප්‍රමාණයකි. මේ නිසා පහත් කුලවල බොහෝ දෙනා අඳ ගොවියන් හෝ කුලී ශ්‍රමිකයන් වශයෙන් ගොවි කුලයේ පිරිස් යටතේ සේවය කරන ලදි. බල ව්‍යුහය තුළ ද ගොවිකුලයේ පිරිස් ශක්තිමත් විය. මේ නිසා ඔවුන්ට වැඩි ගරුත්වයක් හිමි වූ අතර ඉඩම් භුක්තියේ දී මේ තත්වය ඔවුන්ට වාසිදායක ලෙස ක්‍රියාත්මක විය. සාම්ප්‍රදායික සමාජයේ පහත් කුලවල බොහො දෙනා තමතත්වය තුල කටයුතු කළ බව පැහැදිලි විය. මේ තත්වය මත ආර්ථික අතින් ශක්තිමත් වීමට ඔවුන්ට තිබූ අවස්ථාවන් සීමිත විය. පහත් කුල සතුව අඩු ඉඩම් ප්‍රමාණයක් තිබීමට මෙය ද හේතුවක් විය. අන්තර්කුල විවාහ සඳහා තිබූ ඉඩකඩ සීමිත වීම නිසාත්, රැකියා අවස්ථාවන්ගේ පුළුල් වර්ධනයක් නොතිබූ නිසාත් පිටස්තර බලපෑම් ගමට එල්ල නොවූ අතර ගම බාහිර බලපෑම් වලින් තොර හුදකලා ඒකකයක් විය. ඉඩම් සම්බන්ධයෙන් මේ තත්වය සැලකීමේ දී ගමෙහි ඉඩම් පිටස්තර පුද්ගලයන්ට හිමි නොවීමට මෙය හේතුවක් විය. නමුත් පසුගිය දශක කිහිපය තුළ මෙම සාම්ප්‍රදායික සමාජ ව්‍යුහය ක්‍රමයෙන් වෙනස් වී ඇත. ඒ අනුව කුලය සහ ඉඩම් භුක්තිය ද යම් ප්‍රමාණයකට වෙනස් වූ බව පැහැදිලි විය.

දෙවනුව මෙම අධ්‍යයනයේ දී අවධානය යොමු කරනු ලැබුවේ පසුගිය දශක කිහිපය තුළ කුලය සහ ඉඩම් භුක්තිය අතර පැවති සම්බන්ධතාවයේ සිදුවී ඇති වෙනස්වීම් හඳුනාගැනීමටය. මෙහි දී ගොවි කුලය ඉඩම් හිමිකාරිත්වය අතින් අදටත් ඉහළින්ම සිටි බව පැහැදිලි විය. නමුත් පහත් කුලවලට හිමි ඉඩම් ප්‍රමාණය වර්තමානයේ වර්ධනය වී තිබේ. සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂව බෙරව, හේන ආදී කුලවලට හිමි ඉඩම් ප්‍රමාණයේ වර්ධනයක් සිදුවී තිබේ. එසේම ගොවිකුලයේ තිබූ බල ව්‍යුහය කිසියම් දුරකට වෙනස් වී ඇති අතර පහත් යැයි සම්මත කුලවල පිරිස්වලට ද ආර්ථික අතින් ශක්තිමත් වී වැඩි ඉඩම් ප්‍රමාණයක් මිල දී ගැනීමට හැකියාව ලැබී තිබේ. මීට අමතරව ගමට බාහිරින් විවිධ කුලවලට අයත් පුද්ගලයන් ගමට සංක්‍රමණය වී ගැමි ඉඩම් හිමිකරගෙන තිබේ. විශේෂයෙන් පහතරට ප්‍රදේශවල ප්‍රබලව හඳුනාගත හැකි පහත් යැයි සම්මත කුලවලට අයත් කරාව, සලාගම, දුරාව වැනි කුලවලට අයත් පුද්ගලයන් අද ගම තුළ හඳුනාගත හැකිය. බොහෝවිට ඔවුන් විවාහ වී සිටින්නේ ගොවි කුලයට අයත් පුද්ගලයන් සමගය. මේ නිසා ඔවුන්ට වැඩි ඉඩම් ප්‍රමාණයක හිමිකරුවන් වීමට හැකි වී තිබේ. ගමට පිටස්තර පුද්ගලයන් ගමේ ඉඩම් වැඩි වශයෙන් හිමිකරගෙන තිබීම ද හඳුනාගත හැකිය. කෘෂිකාර්මික කටයුතු වලදී පහත් යැයි සම්මත කුලවලට අයත් ඉඩම්වල අඳ ගොවියන් හෝ කුලී ශ්‍රමිකයන් වශයෙන් ගොවිකුලයේ පිරිස් සේවය කරන තත්වයක් වර්තමානයේ හඳුනාගත හැකිය. මෙකී කරුණුවලට අනුව සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂව වර්තමානයේ කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය අතර සම්බන්ධතාවය කිසියම් දුරකට වෙනස් වී ඇති බව කිව යුතුය.

තෙවනුව මෙම අධ්‍යයනයේ දී අවධානය යොමු කරනු ලැබුයේ සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂව කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය අතර සම්බන්ධතාවය වෙනස් වීමට බලපා ඇත්තේ කවර හේතු දැයි හඳුනාගැනීමටය. මෙහිදී වේගයෙන් ව්‍යාප්ත වූ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තීන් කුලය විසින් පුද්ගලයාට හිමිකර දී තිබූ ආරෝපිත සමාජ තත්වයක් සහ කාර්ය කොටස් අභිබවා යමින් ඉහළ සමාජ තත්වයක් කරා ගමන් කිරීමට හැකියාව ලැබී තිබේ. කුලය සමඟ ක්‍රියාත්මක වූ බල ව්‍යුහය ද වෙනස් වී ඇත. මේ අනුව සාම්ප්‍රදායික අවධියේ ගම්පති, කෝරළේ වැනි තනතුරු ගොවි කුලයට පමණක් සීමා වූ අතර එම තත්වයන් වෙනස් වී අධ්‍යාපනය මත තරග විභාග ඔස්සේ පහත් කුලවල පුද්ගලයන්ට ද ඉහළ තනතුරු ලබාගැනීමේ හැකියාව ලැබී තිබේ. කුලය සමග එතෙක් පැවති තහංචි හා මතවාද අභාවයට ගොස් ඇති අතර මේ ආකාරයට කුල ක්‍රමයේ එතෙක් පැවති සාම්ප්‍රදායික බැඳීම් සහ ඍජු බව ලිහිල් වී ඇත. මෙසේ කුලයේ සිදු වූ මෙම වෙනස්වීම් කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය අතර පැවති සම්බන්ධතාවය වෙනස් වීමට ද හේතු වී තිබේ. මීට අමතරව රැකියා තත්වයන්ගේ සිදු වූ ප්‍රසාරණය නිසා පහළ කුල වලට අයත් පුද්ගලයන් ද විවිධ රැකියා අවස්ථා සඳහා ඉඩකඩ ලැබී තිබේ. මේ නිසා ඔවුන්ට ආර්ථික අතින් ශක්තිමත් ව වැඩි වරප්‍රසාද භුක්ති විඳීමට හැකියාව ලැබී ඇත. මෙම රැකියා අවස්ථා පුළුල් වීමත්, අන්තර් කුල විවාහ සඳහා ඉඩකඩ ලැබීමත් තුළ ගමට බාහිරින් ඉහත පෙන්වා දුන් කරාව, සලාගම, දුරාව වැනි කුලවල පුද්ගලයන් ගමට සම්බන්ධ වීමට හේතු වී තිබේ. මීට අමතරව භෞතික වශයෙන් ගමේ සිදු වී ඇති දියුණුව නිසා ගමෙහි ඉඩම්වල වටිනාකම ඉහළ ගොස් තිබේ. මේ නිසා බොහෝ දෙනා ඉඩම් මිල දී ගැනීමට වැඩි කැමැත්තක් දක්වා තිබේ. මෙවැනි පසුබිමක ගමෙහි ඉඩම් පිටස්තර පුද්ගලයන් සතු වී තිබේ. මෙම විග්‍රහය අනුව හඳුනාගත හැකි වූ සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනික හේතුන්ගේ බලපෑම මත කුලය සහ භුක්තිය අතර සම්බන්ධතාවය වෙනස් වී ඇති බව පැහැදිලි විය.

ඉහත සමස්ථ විග්‍රහය අනුව නිගමනය කල හැකි වන්නේ ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ගැමි සමාජ ව්‍යුහය තුළ කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය අතර දැඩි සම්බන්ධතාවයක් පැවති බවත්, නමුත් මෙම සම්බන්ධතාවය මේ රටේ නිදහසින් පසු ඇති වූ සමාජ, ආර්ථික, සංස්කෘතික සහ පරිපාලනමය අංශයන්ගේ සිදු වූ ප්‍රතිසංස්කරණයන් මත බොහෝ දුරට වෙනස් වී ඇති බවත්ය. මෙහි දී සාම්ප්‍රදායික අවධියේ කුලය සහ සම්බන්ධ වූ දැඩි බැඳීම් ලිහිල් වී පහත් යැයි සම්මත කුලවලට ද සමාජය තුළ ඉහළ අතට චලනය වීමට වැඩි ඉඩ ප්‍රස්ථාවක් උදා වී ඇති බව ද නිගමනය කළ හැකිය.

# References


අභයසිංහ, ටිකිරිබංඩා හේරත් 1996, පරංගි කෝට්ටේ, ලේක් හවුස්කොළඹ

අමරසේකර, දයා 1988, ශ්‍රී ලංකා සමාජය, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ

ආරියපාල, ඇම්. බී 1962, මධ්‍යකාලීන ලංකා සමාජය රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ

කරුණාතිලක, කේ 1998, සමාජ විද්‍යා න්‍යාය, මාලිංග ප්‍රකාශකයයෝ, කඩවත

කොඩ්රිංටන්, එච්. ඩබ්. 1980, ලංකාවේ පුරාණ ඉඩම් භුක්තිය හා අදායම, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පීරිස්, රල්ෆ් 1964, සිංහල සමාජ සංවිධානය, සමන් ප්‍රකාශකයෝ, බණ්ඩාරගම (පළමු මුද්‍රණය 1956)

නිසාන්, එලිසබෙත් 2001, ශ්‍රී ලංකාවේ මානව විද්‍යාඥයන්ගේ කෘතීන් (1955/1987), ප්‍රවාද, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය

නොක්ස්, රොබට් 1997, එදා හෙළ දිව, (පරි. ඩේවිඩ් කරුණාරත්න), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ

රත්නපාල, නන්දසේන 2000, සමාජ විද්‍යා පර්යේෂණ මූලධර්ම, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ

සිල්වා, අමරසිරි ද, 2001, සමාජ විද්‍යා පර්යේෂණ ක්‍රමවේදය

සිල්වා, එම්. යු. ද, 1998, ශ්‍රී ලංකාවේ කුල වැඩවසම් ක්‍රමය, අභය මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ , කඩවත

සිල්වා, කාලිංග ටියුඩර් 1997, කුලය පංතිය හා වෙනස්වන ලංකා සමාජය, ප්‍රජා අධ්‍යාපන කවය, මහනුවර

සිල්වා, කාලිංග ටියුඩර් 2000/2001, සමාජ විද්‍යා න්‍යාය සහ ලාංකීය සමාජ විද්‍යාවේ ප්‍රවණතා, සමාජ විමසුම, සමාජ විද්‍යා සංගමය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

Davy, J., 1983, An Account of the Interior of Ceylon and its inhabitants, Tissara Prakashakayo Ltd, Dehiwala. (First Published 1821)

D'oyly, J., 1995, Diary of Mr. John D'oyly, Navrang in Collaboration with Lake Book Ship, Colombo. (First Published)

Leach, E.R., 1960, Pul Eliya: A Village in Ceylon, Cambridge University Press, Cambridge

Obeysekara, G., 1967, Land Tenure in Village Ceylon, Cambridge University Press, Cambridge

Perera, J., 1985, New Dimension of Social Stratification in Rural Sri lanka, Lake House Investments Ltd, Colombo

Rao, C.N.S., 1990, Sociology, Oxford University Press, New Delhi

Ryan, B., 1956, Sinhalese Village, University of Miami Press, Coral Gables Florida

Ryan, B., 1993, Caste in Modern Ceylon, Navrang, New Delhi. (First Published 1953)

Roberts, M., 1995, Caste Conflict and Elite Formation, Navrang, New Delhi

Spencer, Jonathan., 1990, A Sinhala Village in a time of trouble, Oxford University Press

Yalman, N., 1967, Under the Bo Tree: Studies in Caste, Kinship and Marriage in the Interior of Ceylon, Iversity of California Press, Berkeley and Los Angeles.

දිලාන් සඳමල් වික්‍රමසිංහ ගුණවර්ධන
සමාජීයවිද්‍යා අධ්‍යයනාංශය
රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ